*සියලු ම හිමිකම් ඇවිරිණි.*
*முழுப் பதிப்புரிமையுடையது*
*All Rights Reserved*

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**පළමුවන වාර ඇගැයීම**
**முதலாம் தவணை மதிப்பீடு - 2019**
**First Term Evaluation**

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂය / பாடம் / Subject | ඉස්ලාම් | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 3.00 |
|---|---|---|---|---|---|---|---|

# කොටස - I

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1. ඉස්ලාමීය ඉතිහාසය තුළ විශ්වාසය ගොනු කර දීමට බිහි වූ කලාව,

   1. ඉල්මුල් හදීස් 2. ඉල්මුල් කුර්ආන් 3. ඉල්මුල් අකීදා 4. ඉල්මුල් ෆික්හ්

2. අල්ලාහ්ට කිසිවක් සමකිරීම,

   1. ෂිර්ක් වේ 2. කුෆ්ර් වේ 3. ඉල්හාත් වේ 4. රිද්දත් වේ

3. අර් රූහානියියාත් යන්නෙහි අඩංගු දෙයකි,

   1. මහ්ෂර් 2. ආගම් 3. ජින්වරු 4. කලාකද්ර්

4. අකීදාහි පිවිතුරුභාවය රැකගැනීම සඳහා දායකත්වය ලබාදුන් ඉමාම්වරයෙකි,

   1. අබුල් හසන් අල් අෂ්අරී 2. අබූතාලිෆ්
   3. කාලිද් ඉබ්නු වලීද් 4. අෘරාෆි

5. ඊමාන්හි 70කට වඩා වැඩි අංශ ප්‍රමාණයක් අන්තර්ගත වේ. එහි පහළ ම අංශය,

   1. කලීමා
   2. දෙමාපියන්ට යටහත් වීම.
   3. මාර්ගයේ ඇති අනතුරුදායක ද්‍රව්‍ය ඉවත් කිරීම.
   4. යහගුණ

6. සාලිහ් වන 'අමල්' එකක් අල්ලාහ් පිළිගැනීමට ඉතා වැදගත් කොන්දේසියකි,

   1. ලැජ්ජාව 2. චිත්ත පාරිශුද්ධිය 3. ඉවසීම 4. නැමදුම

7. මිනිසා යහමගහි ජීවත් වීමට ඉතා වැදගත් වනුයේ,

   1. රිසාලත් 2. දැනුම 3. පූර්වාදර්ශය 4. අධ්‍යාපනය

8. සුහුෆ් 50ක් පහළ කරනු ලැබූ නබිවරයා,

1. මූසා (අලෛ) තුමා
2. ආදම් (අලෛ) තුමා
3. ෂීද් (අලෛ) තුමා
4. ඉද්රීස් (අලෛ) තුමා

9. නියත වශයෙන් ම අල්ලාහ් පරිශුද්ධ වන්තයන් ප්‍රිය කරයි. යන ප්‍රකාශය,

1. කෞලුස් සහාබි
2. අල් හදීස්
3. අල් කුර්ආන්
4. විද්වතුන්ගේ ප්‍රකාශය

10. පිරිසිදු ජලය වුවත් යමක් පිරිසිදු කිරීමට නොහැකි ජලය,

1. අල්මාඋත් තහූර්
2. අල්මාඋල් මුතනජ්ජිස්
3. අල්මාඋල් තාහිර්
4. අල්මාඋල් මුස්තඃමල්

11. සුළු කිල්ලෙන්මිදි පිරිසිදු වන ක්‍රමය වනුයේ,

1. නෑම
2. පාද සේදීම
3. වුළූඃ කිරීම
4.දෙඅත් සේදීම

12. සාමාන්‍ය නජීස් වර්ගයෙකි,

1. බල්ලාගේ මූත්‍රා
2. මත්පැන්
3. මවුකිරි
4. කූඹියා

13. සිතෙන් සිදු කරනු ලබන දික්ර්,

1. දික්ර් කල්බී
2. දික්ර් ලිසානි
3. තක්බීර්
4. තස්බීහ්

14. කුල්ලතෛන් ප්‍රමාණයට වඩා අඩු ජලය හඳුන්වනු ලබන්නේ,

1. මාඋන් කසීර්
2. මාඋන් මුත්ලක්
3. මාඋන් තාහිර්
4. මාඋන් කලීල්

15. මූලිකව ඉටුකරනු ලබන ඉබාදතයකි,

1. ආහාර ගැනීම
2. රැකියා කිරීම
3. සකාත් දීම
4. දික්ර් කිරීම

16. ඊමානය හා කුෆ්ර් අතර ඇති වෙනස,

1. සකාත්
2. සලාතය
3. ඉබාදතය
4. උපවාසය

17. ''මුහාෆලතුස් සලාත්'' යන්නෙහි අදහස වනුයේ,

1. සලාතය ඉටු කිරීම.
2. සලාතය සුපරීක්ෂාකාරීව ඉටු කිරීම.
3. සලාතයෙහි වැදගත්කම
4. සලාතය මෙහෙයවීම.

18. සලාතයේ අරමුණුවලින් එකකි,

1. නියියත් තැබීම.
2. කිබ්ලාවට පෙරටු කරගෙන සිටීම.
3. දෑත් බැඳීම.
4. සලාම් දීම.

19. ''දුආඋල් ඉස්තිෆ්තාහ්'' යන්නෙහි අදහස,

1. අවසන් දුආ
2. සමාරම්භක දුආ
3. මැද හිදුමෙහි උසුරනු ලබන දුආ
4. සමාරම්භක තක්බීරයෙන් පසු උසුරනු ලබන දුආ

20. ''ෆර්ලු කිෆායා'' යනු,

1. අනිවාර්ය යුතුකමක්
2. සුන්නත් වූ යුතුකමක්
3. සාමූහික යුතුකමක්
4. ලෞකීක යුතුකමක්

21. ''නින්දට වඩා සලාතය උතුම් ය'' යන අදහස දෙන පදය,

1. හයිය අලස්සලා
2. අස්සලාතු හයිරුම් මිනන් නව්මි
3. හයියා අලල්ෆලාහ්
4. අල්ලාහු අක්බර්

22. අත්තස්කියා යනු,

1. ධෛර්යය
2. පිළිවෙළ
3. චිත්ත පාරිශුද්ධිය
4. අවබෝධය

23. ''නෆ්සුල් අම්මාරා බිස්සූඃ '' යන්නෙහි භාෂාමය අර්ථය,

1. තමාව රිදවා ගන්නා සිත
2. අයහපතට පොළඹවන සිත
3. තෘප්තිමත් සිත
4. ඉතා පිරිසිදු සිත

24. සුබහ් හා මඃරිබ් සලාතයට පසුව මුහම්මද් සල්ලල්ලාහු අලෛහිවස්සලාම් තුමාණන් විසින් විශේෂයෙන් උසුලන ලද දුවාවක් වනුයේ,

1. රබ්බි සිද්නි ඉල්මා
2. අල්ලාහුම්ම අජිර්නී මිනන්නාර්
3. වනජ්ජිනා මිනන්නාර්
4. අස්තඃෆිරුල්ලාහ්

25. පළමු අත්තහියාත් පාරායනය කිරීම සඳහා වාඩිවන ක්‍රමය,

1. ඉෆ්තිරාෂ් වේ.
2. තවර්රුක් වේ.
3. ඉඃතිදාල් වේ.
4. ඉන්තිසාෆ් වේ.

26. පරමාන්ත දිනයේ ගැත්තන්ගෙන් ප්‍රථමයෙන් ම අසනු ලබන්නේ කුමක් පිළිබඳව ද?

1. උපවාසය
2. සකාත්
3. සලාතය
4. විවාහය

27. සලාතය උදෙසා ලබා දී ඇති අවකාශයෙකි,

1. වාඩිවී සලාතය ඉටු කිරීම.
2. ඇස් පිය ගැසීම.
3. සලාතය අතහැරීම.
4. සලාතුල් කව්ෆ්

28. ''ෆර්ල්'' වලට අමතරව ඉටුකරනු ලබන ඉබාදතයකි,

1. මුබාහ්
2. මක්රූහ්
3. සුන්නත්
4. ඉමාරත්

29. වචනමය රිද්දත් සඳහා වූ උදාහරණයකි,

1. අල් කුර්ආන් පිටපතක් ඉරා දැමීම. 2. පොළී අනුභව කිරීම

3. නබිවරුන් අගෞරව කිරීම. 4. අල්ලාහ් කෙනෙක් නැත'යි කීම.

30. ශරීරය, සිත හා ධනය සම්බන්ධ ඉබාදතයකි,

1. සකාත් 2. අකීදා 3. හජ් 4. උපවාසය

31. ''ආයත්තුල් කුර්සි'' අඩංගු වී ඇති සූරාව,

1. සූරතුල් කෑෆ් 2. සූරා යාසීන් 3. සූරා මූඃමින් 4. සූරා බකරා

32. නිවසට ඇතුළුවීමට පෙර කිව යුත්තේ,

1. බිස්මි 2. අල්හම්දු 3. සලාම් 4. ෂුක්රන්

33. ඉෆ්තිරාෂ් හිඳුමෙහි පාරායනය කළ යුත්තේ,

1. කුනූත් 2. දුආඋල් ඉස්තිෆ්තාහ් 3. අත් තෂහ්හුත් 4. ෆාතිහා

34. මුස්ලිම්වරුන්ට උකුසුමස් අනුභව කිරීම තහනම් ය. ඊට හේතුව වන්නේ ,

1. ඌ මාංශ භක්ෂකයෙකු වීම. 2. ඌ කුරුල්ලෙකු වීම.

3. ඌ හොටෙන් දඩයම් කරන කුරුල්ලෙකු වීම. 4. ඌ නියපොත්තෙන් දඩයම් කරන නිසා.

35. අල් කුර්ආනයේ ඇති කුඩා ම සූරාව,

1. ඉහ්ලාස් 2. අල් කව්සර් 3. අල් අස්ර් 4. අන් නාස්

36. 'මහ්ෂර්' ඉස්ලාමීය අකීදාවේ කුමන අංගය හා සම්බන්ධ ද?

1. ඉලාහියියාත් 2. සම්ඉයියාත් 3. රූහානියියාත් 4. නුබුව්වාත්

37. ඉස්ලාමීය පාලනයේ කෙළින්ම මරණීය දණ්ඩනයට යටත් වන්නා හඳුන්වනු ලබන්නේ,

1. මුනාෆික් 2. මූඃමින් 3. කාෆිර් 4. මුර්තද්

38. වුළූඃ හි අංගයක ජබීරත් දමා ඇති අවස්ථාවක සලාතය ඉටුකිරීම සඳහා කළ යුත්තේ,

1. වුළූඃ පමණක් 2. තයම්මුම් පමණක්

3. වුළූඃ හා තයම්මුම් 4. ඉහත සඳහන් සියල්ල

39. පොළොව සරු කිරීම සඳහා මිනිසා විසින් ඉටුකරනු ලබන ක්‍රියාවන්,

1. ඉමාරත් වේ. 2. කිලාෆත් වේ. 3. ඉබාදත් වේ. 4. මුආමලාත් වේ.

40. පංච කාල සලාතයේ ඇති මුළු රක්අත් ගණන,

1. 13 2. 17 3. 21 4. 20

සියලු ම හිමිකම් ඇවිරිණි.
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමුවන වාර ඇගැයීම
முதலாம் தவணை மதிப்பீடு - 2019
First Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade } 10 | විෂය / பாடம் / Subject } | ඉස්ලාම් | පත්‍රය / வினாத்தாள் / Paper } II |

- **පළමුවන ප්‍රශ්නය ඇතුළු තවත් ඕනෑම ප්‍රශ්න හතරක් තෝරා ප්‍රශ්න පහකට උත්තර ලියන්න.**
- **පළමුවන ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් ද අනෙක් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින් ද වේ.**

## (01) කෙටි පිළිතුරු සපයන්න.

1. ඉස්ලාමීය සාම්ප්‍රදාය තුළ අකීදා යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
2. අකීදා කලාවේ අර් රූහානියියාත් යන කොටසේ අඩංගු දේවල් මොනවා ද?
3. ඉස්ලාමීය අකීදාවට පටහැනි චින්තන බිහිවීමට හේතු **දෙකක්** ලියන්න.
4. ඉස්ලාමීය සාම්ප්‍රදායයේ **ඉබාදත්** යන්න පැහැදිලි කරන්න.
5. '**ඉබාදත්**' හි අරමුණු **දෙකක්** ලියන්න.
6. ''**ෆර්ලු කිෆායා**'' සඳහා උදාහරණ **දෙකක්** ලියන්න.
7. ''**තක්බීර් තහ්රීමා**'' යන්න පැහැදිලි කරන්න.
8. සලාතයේ සජදාහිදී පොළොවේ පතිත විය යුතු ශරීරයේ අවයව සංඛ්‍යාව කොපමණ ද?
9. යහගුණ වලින් යුත් නබි සල්ලල්ලාහු (අලෛ) තුමාණන්ව කුඩා කලදී හඳුන්වනු ලැබූ උතුම් නම් **දෙකක්** ලියන්න.
10. නබි සල්ලල්ලාහු (අලෛ) තුමාණන් '**මිහ්රාජ්**' ගිය මාසය කුමක් ද?

(ලකුණු 2x10 = 20)

**(02)**

1. ඉල්මුල් අකීදාවට අදාළ වූ මූලාශ්‍රයන් කුමක් ද?
2. අකීදාවට පටහැනිව බිහිවූ පිරිස් **3ක්** ලියන්න.
3. මූලික විශ්වාසයන් අකීදා කලාවේ විද්වතුන් විසින් කොටස් 4කට බෙදා පැහැදිලි කළහ. එම කොටස් 4 උදාහරණ සහිත ලියා දක්වන්න.

(2+3+5 =10)

**(03)** 1. විශ්වාසය කර යහපත් ක්‍රියාවන්හි යෙදුණු අයට අල්ලාහ්ගෙන් ලැබෙන කුලිය කුමක්ද?

2. මුඃමින්වරයකුගේ ක්‍රියා කලාපයන් කෙසේ සිදුවේද?

3. සලාතයෙන් පසුව පාරායනය කළ යුතු දේවල් **පහක්** ලියන්න.

(2+3+5 =10)

**(04)** 1. රිසාලත්, හිදායත් යන අංශයන් දෙක මිනිසාට අවශ්‍යයි යන්නට හේතු වූ කාරණා **දෙකක්** ලියන්න.

2. සුහුෆ් පහළ කරන ලද නබිවරුන් හා ඔවුන්ට පහළ කරන ලද සුහුෆ් සංඛ්‍යා වගුගත කරන්න.

3. සූරා ෆුර්කාන් හි සඳහන් පරිදි දේව ගැත්තන්ගේ යහගුණාංග **පහක්** ලියා දක්වන්න.

(2+3+5 =10)

**(05)** 1. පිරිසිදු භාවයේ වැදගත් කම පිළිබඳ හදීසයක් සඳහන් කරන්න.

2. ජලයෙහි **කොටස් 3** නම් කරන්න.

3. තයම්මුම් යනු කුමක් ද? තයම්මුම් කළ හැකි අවස්ථා **3ක්** ලියන්න.

(2+3+5 =10)

**(06)** 1. තස්කියා යන්න පැහැදිලි කරන්න.

2. අල් කුර්ආනයෙහි සඳහන් පරිදි මිනිස් සිතෙහි තත්වයන් 3 ලියා දක්වන්න.

3. මිනිස් සිතෙහි චිත්ත පාරිශුද්ධිය ඇති වීමට මිනිසා විසින් අනුගමනය කළයුතු ක්‍රියා **පහක්** ලියන්න.

(2+3+5 =10)

**(07)** 1. ඉබාදත් හි කොටස් නම් කරන්න.

2. දෛනික ක්‍රියාවන් ඉබාදත් ලෙස පිළිගැනීමට හේතු කාරණා **3ක්** ලියන්න.

3. සලාතයේ වැදගත්කම් **පහක්** ලියන්න.

(2+3+5 =10)

***